**ශීර්ෂය 155 - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 155 - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් සහ සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.1 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 28,927.14 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 25,979.98ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,947.16 ක් හෙවත් සියයට 10.18 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 2,264.58 | 1,129.90 | 1,134.68 | 50.1 |
| මූලධන | 26,662.56 | 24,850.08 | 1,812.48 | 6.8 |
| **එකතුව** | **28,927.14** | **25,979.98** | **2,947.16** | **10.18** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15501 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15501 | 11 | 10.99 | 5.20 | 6.34 | 35.00 | 27.82 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 106.94 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0165/000 | 0.39 |
| 6000/0000/00/0013/0120/000 | 1.30 |
| 6000/0000/00/0016/0110/000 | 104.87 |
| 6000/0000/00/0018/0109/000 | 0.38 |
| **එකතුව** | **106.94** |

## 2.4 විගණන නිරීක්ෂණය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයන් ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---

3.1 **ලේඛණ හා පොත් පත් පවත්වා නොතිබීම**

---

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.2 **විසර්ජන ගිණුම**

---

3.2.1 **අයවැය විචලනය**

---

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, වැය විෂයයන් 38 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.

3.2.2 **හෙළිදරව් නොකළ බැරකම්**

---

155-02-04-01-2202 සංවර්ධන සහායන් වැය විෂය යටතේ පෞද්ගලික සමාගමකට ලංකා බැංකුවේ ණයවර ලිපි මගින් රු.මිලියන 3,129.46 ක් ගෙවා තිබූ අතර එම මුදල 2014 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍ර වෙනුවෙන් ණය හා පොලිය ඇතුළත් වාරික මුදල විය. ඇස්තමේන්තු සකස් කිරීමේදී මේ පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

3.2.3 **ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව**

---

ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවෙහි සඳහන් ශේෂයන් ස්ථාවර වත්කම් ලේඛනයේ අගයන් සමඟ සැසඳෙන බව ප්‍රකාශ කර ඇතත්, රු.611,000ක වටිනාකමින් යුත් පරිගණක සඳහා බාහිර දෘඩ තැටි ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

වර්ෂයේ එකතු කිරීම් මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන වත්කම් අත්පත් කර ගැනීම්හි දක්වා ඇති අගයන් සමඟ ද සමාන නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.3 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 15501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දින විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 1.07 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණද එම ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

3.4 **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

3.4.1 **බේරුම් නොකළ බැරකම්**

---

2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමකින් මිලදී ගත් යන්ත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු වාරික මුදල හා පොළිය (ඇ.එ.ඩොලර් 20,326,539.40) රු.මිලියන 3,027.03 ක් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

**3.4.2 විදේශ ආධාර ව්‍යාපෘති**

**(අ) ව්‍යාපෘතියේ වත්කම් ඌන උපයෝජනය /නිෂ්ක්‍රීයව පැවතිම**

**(i) නිශ්ක්‍රීය වත්කම්**

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) යටතේ සිදුකරන ලද පහත සඳහන් ඉදිකිරීම් නිමකර අදාළ පළාත් පාලන ආයතන වෙත භාරදී තිබුණද 2017 සැප්තම්බර් 27 දින වන විටත් භාවිතය සඳහා විවෘත නොකර නිශ්ක්‍රීයව තිබුණි.

| පළාත | පළාත් පාලන ආයතනය සහ ඉදිකිරීමේ ස්වභාවය | පිරිවැය<br>රු. මිලියන | පළාත් පාලන ආයතන වෙත භාරදුන් දිනය |
|---|---|---|---|
| බස්නාහිර | දිවුලපිටිය ප්‍රාදේශීය සභාව - ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල | 52.35 | 2015 දෙසැම්බර් 01 |
| බස්නාහිර | සීතාවක ප්‍රාදේශීය සභාව - පුස්තකාල ගොඩනැගිල්ල | 36.70 | 2016 ජූලි 04 |
| සබරගමුව | දැරණියගල ප්‍රාදේශීය සභාව - බහුකාර්ය ගොඩනැගිල්ල | 41.00 | 2016 අප්‍රේල් 11 |
| සබරගමුව | යටියන්තොට ප්‍රාදේශීය සභාව - සතිපොළ සහ පොදු වැසිකිළි | 39.00 | 2017 පෙබරවාරි 01 |
| මධ්‍යම | රත්තොට ප්‍රාදේශීය සභාව - සතිපොළ | 13.70 | 2015 මාර්තු 17 |
| උතුරු මැද | ගල්නෑව ප්‍රාදේශීය සභාව - සතිපොළ සහ වැසිකිළි පද්ධතිය | 13.78 | 2014 අගෝස්තු 23 |

**(ii) ඌන උපයෝජිත වත්කම්**

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ එකතුව රු.මිලියන 495.73 ක් වැය කර ගොඩනැගිලි ව්‍යාපෘති 16 ක් ඉදිකර නිමකර තිබුණි. එම ගොඩනැගිලිවල පහත සඳහන් කොටස අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතුණි.

| පළාත | පළාත් පාලන ආයතනය සහ ඉදිකිරීමේ ස්වභාවය | ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණ පිරිවැය | 2017 ජූනි 01 දිනට ඌන උපයෝජිතව පැවති ගොඩනැගිලි කොටස |
|---|---|---|---|
| --------- | ------------------------------ | ------------ | ------------------------------------------ |
| | | රු. මිලියන | |
| බස්නාහිර | බියගම ප්‍රාදේශීය සභාව - බහුකාර්ය ගොඩනැගිල්ල | 43.31 | ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති වීම නිසා ශ්‍රවණාගාරය භාවිතයට නොගැනීම. |
| බස්නාහිර | මදුරාවල ප්‍රාදේශීය සභාව - බහුකාර්ය ගොඩනැගිල්ල | 22.32 | සතියට වරක් ආයුර්වේද සායනය පමණක් පවත්වන අතර බටහිර වෛද්‍ය සායනය සහ ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට නොගැනීම. |
| බස්නාහිර | ඉත්තෑපාන ප්‍රාදේශීය සභාව - බහුකාර්ය ගොඩනැගිල්ල | 23.83 | ශ්‍රවණාගාරය භාවිතය සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොතිබීම. |
| දකුණ | නාගොඩ ප්‍රාදේශීය සභාව - සතිපොළ සහ බහුකාර්ය ගොඩනැගිල්ල | 49.29 | පෙර පාසල සහ ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට නොගැනීම. |
| දකුණ | කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව - බස් නැවතුම්පොළ සහ සතිපොළ | 36.37 | ශ්‍රවණාගාරය සහ සතිපොළෙහි ඇති මාළු වෙළඳපොළ ප්‍රයෝජනයට නොගැනීම |
| දකුණ | තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාව - සතිපොළ | 50.00 | වර්ග මීටර් 71කින් සමන්විත ගොඩනැගිලි 02ක් භාවිතයට නොගැනීම |
| දකුණ | කටුවන ප්‍රාදේශීය සභාව - බස් නැවතුම්පොළ (උඩු මහලක් සහිත ගොඩනැගිල්ල) | 36.29 | මාස 16කට වඩා වැඩි කාලයක් පුරා භාවිතයෙන් තොරව පැවැතීම |
| සබරගමුව | අයගම ප්‍රාදේශීය සභාව - සතිපොළ | 9.82 | බදු කුලී තක්සේරු කර නොමැති වීම හේතුවෙන් වසර 02කට වඩා වැඩි කාලයක් භාවිතයෙන් තොරව පැවැතීම. |

| | | | |
|---|---|---|---|
| සබරගමුව | අයගම ප්‍රාදේශීය සභාව - බස් නැවතුම්පොළ සහ බහුකාර්ය ගොඩනැගිල්ල | 34.65 | වසරක් ඉක්ම ගියද කඩ සාප්පු බදු දීම සඳහා පියවරක් නොගැනීම සහ ශ්‍රවණාගාරයද අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීම. |
| සබරගමුව | ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව - බහුකාර්ය ගොඩනැගිල්ල | 35.30 | ප්‍රා.සභාවේ උප කාර්යාලය පමණක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලේ කොටසක් භාවිතයට ගැනීම. |
| මධ්‍යම | ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව - තැන්නේකුඹුර බහුකාර්ය ගොඩනැගිල්ල | 22.73 | ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති වීම නිසා ශ්‍රවණාගාරය භාවිතයට නොගැනීම. |
| මධ්‍යම | ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව - ගුරුදෙණිය බහුකාර්ය ගොඩනැගිල්ල | 23.73 | වෛද්‍ය සායනය පැවැත්වීම සඳහා පමණක් භාවිතයට ගනී. |
| මධ්‍යම | හුන්නස්ගිරිය ප්‍රාදේශීය සභාව - බහුකාර්ය ගොඩනැගිල්ල | 40.43 | ශ්‍රවණාගාරය සහ වෛද්‍ය සායනය ප්‍රයෝජනයට නොගැනීම. |
| ඌව | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව -කාර්යාල ගොඩනැගිල්ල සහ සතිපොළ | 35.85 | සතිපොළ සඳහා පිවිසුම් මාර්ගය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සතිපොළ භාවිතයෙන් තොරව පවතින අතර කාර්යාලය නව ගොඩනැගිල්ල වෙත ගෙන ගොස් නොමැති වීම. |
| උතුරුමැද | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව - සතිපොළ | 14.45 | වෙළඳ කුටි පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරිකයන්ගෙන් ප්‍රමාණවත් ඉල්ලුමක් නොතිබීම. |
| උතුරුමැද | පදවිය ප්‍රාදේශීය සභාව - කාර්යාල ගොඩනැගිල්ල | 17.36 | ඉදි කළ ගොඩනැගිල්ලේ විවිධ අඩුපාඩු පැවතීම. |

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

**-----------------------------------------**

උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන) යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ කිලෝමීටර 12.85 ක් වූ මාර්ග පැකේජයක ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණේ ව්‍යාපෘති කටයුතු ආරම්භ කර වර්ෂ 2 ½ කට පසුව බව නිරීක්ෂණය වූ අතර, එහි ඉදිකිරීම් කටයුතු 2017 මැයි 17 දින වනවිට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව 2017 අප්‍රේල් 30 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 75 ක් බව තවදුරටත් නිරීක්ෂණය විය. තවද, කිළිනොච්චි දිස්ත්‍රික්කයේ එක් මාර්ග

පැකේජයක ඉදිකිරීම් කටයුතු 2014 දෙසැම්බර් 31 දින ආරම්භ කර තිබූ අතර 2016 අගෝස්තු 09 දින වනවිට නිමකිරීමට අපේක්ෂිතව තිබුණි. 2017 අප්‍රේල් 30 දින විට එහි භෞතික ප්‍රගතිය සියයට 78 ක් විය.

**(ඇ) ව්‍යාපෘති නිම කිරීමෙන් පසු ප්‍රතිලාභ**

**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)**

(i) රු.මිලියන 28.63 ක වියදමින් ඉදිකරන ලද පාලින්ද නුවර ජල යෝජනා ක්‍රමය හා රෙමුණ ජල යෝජනා ක්‍රමය සම්බන්ධ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* ස්වභාවික ජල මූලාශ්‍ර භාවිතා කරමින් ඉදිකරන ලද පාලින්ද නුවර ජල යෝජනා ක්‍රමය මගින් පවුල් 360 කට පානීය ජලය ලබාදීමට යෝජිතව තිබුණ ද ජල මූලාශ්‍රයේ ආරම්භක පෙදසේ ජීවත්වන අනවසර පදිංචිකරුවන් නිසා ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම හේතුවෙන් ජලය පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ පවතින බැවින් ජලය ලබාදී නොතිබුණි.

* රෙමුණ ජල යෝජනා ක්‍රමයේ ජල ටැංකියට සවිකර ඇති විදුලි මෝටර් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් විදුලි ධාරිතාවක් නොමැති වීමෙන් ජල යෝජනා ක්‍රමයේ අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට ලැබී නොතිබුණි.

(ii) ව්‍යාපෘති අරමුදල්වලින් උතුරු මැද පළාතේ මහඉලුප්පල්ලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රු.මිලියන 2.82 ක වියදමින් ඉදිකරන ලද සනීපාරක්ෂක මධ්‍යස්ථානය සහ රු.මිලියන 2.50 ක වියදමක් දරා ඉදිකරන ලද තිරප්පනේ සනීපාරක්ෂක මධ්‍යස්ථානය ජලපහසුකම් නොමැති වීම සහ මහජනතාවට පහසුවෙන් ළඟාවිය නොහැකි වීම හේතුවෙන් භාවිතයෙන් තොරවී තිබුණි.

**(ඈ) ව්‍යාපෘතිය නිසා පරිසරයට වන බලපෑම්**

**මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය**

(i) කොන්ත්‍රාත්තුවෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරන අතරතුර එම ප්‍රදේශයේ නිවාස 22 කට ආසන්න ප්‍රමාණයක් හානියට පත්වී ඇති අතර එහි නිවාස 07 කට ආසන්න ප්‍රමාණයක් ව්‍යාපෘතිය මගින් 2017 අගෝස්තු 07 දින වනවිටත් අළුත්වැඩියාවන් සිදුකර නොතිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා කැනීම් කිරීමේදී දේපළ ගිලා බැසීම සිදු නොවන ආකාරයට අවශ්‍ය ආරක්ෂක උපක්‍රම භාවිතා කල යුතු වුවද (උදා:- පැතිබැම් බැඳීම) එවැනි ක්‍රියාමාර්ග භාවිතා නොකිරීමෙන් මහජන දේපල හානිවීමේ තත්ත්වයක් උද්ගත වී ඇති බව නිරීක්ෂණය විය. මෙම කොන්ත්‍රාත් ක්‍රියාවලිය නිසා ප්‍රදේශයේ ජනතාව සමඟ දිගින් දිගටම සිදුවන ගැටීම්, ආයතනය සහ මහජනයා අතර විශ්වාසය බිඳ වැටීමට හේතු වී ඇති අතර ඉදිරි සංවර්ධන කටයුතු වලදී ද එය අහිතකර ලෙස බලපානු ඇත.

(ii) ඉදිකිරීම් සිදුවන ප්‍රදේශ ආශ්‍රිතව පදිංචි නිවාස දේපල සම්බන්ධයෙන් පූර්ව සමීක්ෂණයක් සිදුකොට තොරතුරු රැස්කර ගත යුතු වුවත් දේපල හානි වීමට ප්‍රථම එවැනි තොරතුරු රැස් කිරීමක් සිදු නොකර දේපල හානිවීමෙන් පසු අදාළ සමීක්ෂණය සිදුකොට තොරතුරු රැස් කර තිබුණි. ඒ අනුව අදාළ ඉදිකිරීම්වලදී සිදුවිය හැකි හානිවීම් සහ බලපෑම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබූ බව අනාවරණය විය.

**3.4.3** **කාර්යසාධනය**

----------------

**(අ)** **ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහයක මධ්‍යස්ථානය**

---------------------------------------------------------------

(i) 2016 වාර්ෂික ඇස්තමේන්තුව මගින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 100 ක මුදලක් වෙන්කර තිබූ අතර අතිරේක ප්‍රතිපාදන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව මාරු කිරීම් ද ඇතුළුව ප්‍රතිපාදන රු. මිලියන 334.31 ක් දක්වා වැඩි කරවාගෙන තිබුණි. එසේ වුවද ඝණ අපද්‍රව්‍ය සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි.

(ii) මෙම වැය විෂය යටතේ මීතොටමුල්ල කසල අංගනය අසල පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා රු.මිලියන 105 ක මුදලක් කොළඹ මහනගර සභාවට ගෙවා තිබූ අතර ගංවතුර හේතුවෙන් හානියට පත් වූ කොලොන්නාව හා කොටිකාවත්ත ප්‍රදේශ පවිත්‍ර කිරීම සඳහා රු.මිලියන 10.19 ක් වැය කර තිබුණ ද අපද්‍රව්‍ය කළමනාකරණ කිරීමේ තිරසාර වැඩ පිළිවෙලක් නොතිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) තිරසාර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අධ්‍යයන හෝ පර්යේෂණ සඳහා අවධානය යොමු කර නොතිබුණි.

**(ආ)** **සංවර්ධන අංශය**

-----------------

**(i)** **බෙලිඅත්ත නගර සංවර්ධනය**

----------------------------------

2014 වර්ෂයේදි බෙලිඅත්ත නාගරික පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අත්තිකාරම් ලෙස ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.මිලියන 68 ක මුදලක් ගෙවා තිබුණද ඊට අදාළ ඉදිකිරීමක් සිදුකර නොතිබුණි. නාගරික පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය වෙනුවට එම ස්ථානයේ වාහන නැවතුම්පොළක් සඳහා භූමිය සකස් කර තිබුණි. ඉහත මුළු අත්තිකාරම් මුදල සත්‍ය වියදමක් වී නොතිබුණ ද අමාත්‍යාංශයේ ගිණුම් වාර්තා අනුව එම වසරේ දී වියදමක් ලෙස ගිණුම් ගත කොට තිබුණි. 2017 සැප්තම්බර් 27 දිනය දක්වාත් ගෙවා තිබූ රු. මිලියන 68 ක අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට ද නොහැකි වී තිබුණි.

**(ii)** **ව්‍යාපෘති නිමනොකර අත්හැරීම**

---------------------------------

2015 වර්ෂය අවසන් වන විට නිම කිරීමට සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් 12ක් අර්ධ වශයෙන් නිම කර අත්හැර දමා තිබුණි. එහෙයින් එම ව්‍යාපෘතින් වෙනුවෙන් මෙතෙක් දරන ලද රු.මිලියන 31.18 ක මුදල ඵලදායි නොවන වියදමක් බවට පත් වී තිබුණි.

| ව්‍යාපෘතිය<br>--------- | 2016 දෙසැම්බර් 31 දිනට<br>භෞතික ප්‍රගතිය<br>----------<br>% | <br>මූල්‍ය ප්‍රගතිය<br>--------<br>% | <br>සත්‍ය වියදම<br>------------<br>රු.මිලියන |
|---|---|---|---|
| <u>පල්ලෙපොළ නගර සංවර්ධනය</u> | | | |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම. | 50 | 18 | 0.28 |
| ටී.බී. තෙන්නකෝන් අනුස්මරණ ළමා උද්‍යානය වැඩි දියුණු කිරීම. | 50 | - | 0.78 |

| | | | |
|---|---|---|---|
| **<u>පඬුවස්නුවර නගර සංවර්ධනය</u>** | | | |
| හෙට්ටිපොළ නාගරික පදික වේදිකාවේ ඉතිරි වැඩ නිමකිරීම. | 50 | 78 | 1.72 |
| **<u>අක්කරෙයිපත්තු නගර සංවර්ධනය</u>** | | | |
| පොදු වෙළඳපොළ ඉදිකිරීම - අදියර 2 | 20 | - | 7.55 |
| අක්කරෙයිපත්තු නගර සභාවට අයත් කලාගාරය ඉදිකිරීම - අදියර 3 | 20 | 3 | 0.45 |
| ජල උද්‍යාන සඳහා අභ්‍යන්තර විදුලි ආලෝක කරණ පද්ධතියක් ඉදිකිරීම. | 20 | 5 | 0.21 |
| **<u>ජාතික සංවර්ධන වැඩසටහන</u>** | | | |
| පෝරතීවුපත්තු පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම. | 50 | - | 1.93 |
| දමන ප්‍රාදේශීය සභාවේ සංචාරක නිවාසය ඉදිකිරීම. | 20 | - | 1.44 |
| වෙරුගල් ප්‍රාදේශීය සභාවේ ළමා උද්‍යානය ඉදිකිරීම. | 60 | - | 2.95 |
| **<u>හදිසි ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ වැඩසටහන</u>** | | | |
| අම්පාර නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම. | 30 | - | 2.42 |
| මඩකලපුව නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම. | 30 | - | 8.22 |
| අක්කරෙයිපත්තු නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම. | 30 | - | 3.23 |
| | | | -------- |
| **එකතුව** | | | **31.18** |
| | | | **====** |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 28 | 07 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 04 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 150 | 139 | 11 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 55 | 74 | - | 19 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ..) | 01 | - | 01 | - |
| | | 245 | 245 | 18 | 19 |

**(ආ) වෙනත් ආයතන සතු මානව සම්පත් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මෙම අමාත්‍යාංශය යටතේ පවතින පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරිය සහ උපදේශක (ඉංජිනේරු) යන නිලධාරීන් දෙදෙනා මූල්‍ය වංචාවක් සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක චූදිත නිලධාරීන් බවට පත්ව ඇති අතර එම නිලධාරීන් අමාත්‍යාංශයට අනුයුක්ත කරවාගෙන තිබූ අතර පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් වැටුප් ගෙවා තිබුණි.